පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.17 පැය 1835 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 80 /2025 |
| විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk | | | | |

**ටී56 ගිනි අවියක් සහ පතරොම් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

වැඩබලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදු කරගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව 2025.01.11 වන දින වැල්ලම්පිටිය පොලිස් ස්ථානය මගින් පිස්තෝල අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන රඳවුම් නියෝග මත රඳවාගෙන වැඩිදුර විමර්ශන සිදු කර ඇත.

එහිදී අනාවරණය වූ තොරතුරු මත තවත් සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීම සඳහා 2025.01.14 වන දින කොළඹ අපරාධ කොට්ඨාසයේ සංවිධානාත්මක අපරාධ විමර්ශන ඒකකයේ නිලධාරීන් කණ්ඩායම් විසින් වැලිකන්ද ප්‍රදේශයට පිටව ගොස් ඇත. ඒ අනුව 2025.01.16 වන දින වැලිකන්ද පොලිස් වසමේ රුහුණුකෙත ප්‍රදේශයේදී නීත්‍යානුකූල බලපත්‍රයක් නොමැතිව ටී56 ගිනි අවියක්, එම පතරොම් ගැබක් හා එම ජීව පතරොම් 18 ක් සමඟ සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 53 ක් වන රුහුණුකෙත, වැලිකන්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු 1995 වර්ෂයේ සිවිල් ආරක්ෂක දෙපාතර්මේන්තුවේ සේවයට බැඳී සිවිල් ආරක්ෂක බලකා නියාමකවරයෙකු වශයෙන් පොළොන්නරුව බලකායට අනියුක්තව වැලිකන්ද පොලිස් ස්ථානයේ රාජකාරි කරනු ලබන බවට අනාවරණය වී ඇත. සැකකරුගෙන් සිදුකරන ලද ප්‍රශ්න කිරීමේදී, මෙම ගිනි අවිය යුධ සමයේ එල්ටීටීඊ සමාජිකයින් සිටි ස්ථානයක තිබී සොයා ගෙන නිවසට රැගෙන පැමිණි බවට ප්‍රකාශ කර ඇත. ඒ අනුව මෙම ගිනි අවිය භාවිතා කර යම් අපරාධයක් සිදු කර ඇතිද, අපරාධයක් සඳහා වෙනත් අයෙකුට ලබාදී ඇතිද, මීට අමතර වෙනත් ගිනි අවි සැකකරු මගින් සංසරණය වී ඇතිද යන්න සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන කටයුතු සිදුකරනු ලබයි.

අත්අඩංගුවට ගත් දේපළ වල ඡායාරූප.





**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**